www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආධාර සමුලුව ශ්‍රී ලංකාවේ දේශපාලන හිරවීම අවධාරනය කරයි

## Aid conference highlights political impasse in Sri Lanka

**නන්ද වික්‍රමසිංහ හා කේ. රත්නායක විසිනි**
**2005 මැයි 27**

එක්සත් ජනපදය, යුරෝපා සංගමය, චීනය සහ ඉන්දියාව ඇතුලු රටවල් 50කින් ද ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ඒජන්සිවලින් ද පැමිනි 120ක පමන නියෝජිත පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව, ප්‍රධාන ජාත්‍යන්තර ආධාර සමුලුවක් මැයි 16-17 දිනවල ශ්‍රී ලංකාවේ මහනුවර නගරයේ දී පවත්වන ලදි.

ශ්‍රී ලංකා ආන්ඩුව සමුලුව දැවැන්ත ජයග්‍රහනයක් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රශංසාවට ලක් කර ඇත. මුදල් ඇමති සරත් අමුනුගම රැස්වීම විස්තර කලේ, රටට බලාපොරොත්තු වූවාටත් වඩා ආධාර සැපයූ සහ එපමනක් නොව, අඩු ගනනේ නිල වසයෙන් ගත් කල, ඒ සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් නොපැනවූ "අති දැවැන්ත ජයග්‍රහනයක්" ලෙස ය.

එහෙත් කොලඹ දේශපාලන සංස්ථාපිතය හොඳින් දන්නා පරිදි, සැලකිය යුතු මට්ටමේ මූල්‍ය ආධාර ලැබෙනු ඇත්තේ කොන්දේසි දෙකක් ඉටු කල හොත් පමනකි: එනම්, ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් අඛන්ඩව ගෙන යාම සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග හිර වී ඇති සාම සාකච්ඡා යලි ඇරඹීමට පියවර ගැනීමයි. කෙසේ වෙතත්, මෙම පියවර, ආන්ඩුව තුල ම ආතතීන් ද ඇතුලු, දිවයින තුල සමාජ හා දේශපාලනික ආතතීන් උත්සන්න කර තිබේ.

මහනුවර රැස්වීම, 2003 ජූනි මස ටෝකියෝවේ දී පැවති, ඩොලර් බිලියන 4.5ක ආධාර පොරොන්දු වූ, ආධාර දෙන රටවල හා ආයතනවල සමුලුවට පසුව පැවති ප්‍රථම සමුලුව වන අතර ශ්‍රී ලංකාව තුල මෙවන් සමුලුවක් පැවැත්වූ පලමු අවස්ථාව ද විය. ටෝකියෝ සමුලුවේ පොරොන්දු වූ ආධාර එල්ටීටීඊය සමග සාකච්ඡා යලි ඇරඹීමේ කොන්දේසියට සම්බන්ධ කොට තිබූ බැවින් එම ආධාරවලින් කිසිවක් ම පාහේ ලැබී නැත. කුමාරතුංග මිලිටරියේ ඉහල නිලධාරි පැලැන්තිය හා සිංහල අන්තවාදී කන්ඩායම් සමග සන්ධානගතව, පාලක එක්සත් ජාතික පෙරමුනටත් (එජාපෙ) සාම ක්‍රියාදාමයටත් එරෙහිව දුෂ්ඨ උද්ඝෝෂනයක් ගෙන ගිය අතර අවසානයේ දී 2004 පෙබරවාරියේ දී ආන්ඩුව බලයෙන් පහ කලා ය.

2004 අප්‍රේල් මැතිවරනයෙන් යන්තම් ජය ලැබූ එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස), ඉතා අසීරු මූල්‍ය තත්වයකට හා එල්ටීටීඊය සමග සාකච්ඡා යලි අරඹන ලෙස ව්‍යාපාරික නායකයන් වෙතින් එල්ල වූ පීඩනයට මුහුන දීමට සිදු විය. කුමාරතුංග අංශක 180කින් හදිසි හැරීමක් ගෙන සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ සිය අභිප්‍රාය ප්‍රකාශයට පත් කලා ය. වසරක් ගත වීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් සිදු වී නැත. එජනිස සභාගයේ ප්‍රධාන කොටස්කරුවකු වන සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), එල්ටීටීඊයට මොන යම් හෝ සහනයක්, සීමිත සහනයක් පවා, දීමට විරුද්ධ වී ඇත.

40,000කට ආසන්න ජන සංඛ්‍යාවක් මරුමුවට පත් කරමින්, මිලියනයකට අධික ජනයාගේ ජීවිත කඩාකප්පල් කරමින්, අඩු ගනනේ ඩොලර් බිලියන 1.5ක් ලෙස තක්සේරු කෙරුනු විනාශයක් සිදු කල සුනාමි ව්‍යසනය මගින් රටේ මූල්‍ය අර්බුදය උත්සන්න කෙරී ඇත. ආධාර බෙදා හැරීම පිනිස එල්ටීටීඊය සමග "ඒකාබද්ධ යාන්ත්‍රනයක්" පිහිටුවීමට අපොහොසත් වීම හේතුවෙන් ජාත්‍යන්තර සුනාමි ආධාර ලෙස පොරොන්දු වූ ඩොලර් බිලියන 1.8ක මුදල් ලබා දීම ප්‍රතික්ෂේප කෙරී ඇත. එමෙන් ම, සුනාමියෙන් විපතට පත් ජනතාවගේ දුක් වේදනාවන් තුනී කිරීමටත් මොන යම් හෝ අර්ථවත් ප්‍රතිනිර්මාන කටයුත්තක් ආරම්භ කිරීමටත් ආන්ඩුව තවමත් අපොහොසත් වීම හේතු කොටගෙන, මහජන වෛරය හා පිලිකුල වැඩෙමින් පවතී.

අතිශයින් ම ආතති සහගත දේශපාලන තත්වය ද පාලක ප්‍රභූව තුල පවත්නා ගැඹුරු භේදයන් ද මහනුවර සමුලුවේ සාකච්ඡා තුල දී විවෘතව ප්‍රදර්ශනය කෙරුනි. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමුලුවට සහභාගි නොවූ අතර ඒ වෙනුවට ආන්ඩුව හෙලීමේ උද්ඝෝෂනයක් දියත් කලේ ය. එල්ටීටීඊයට හිතැති දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) ද, ආධාර බෙදාහැරීම සම්බන්ධයෙන් ගිවිසුමකට එලඹීමට ආන්ඩුව අපොහොසත් වීම පිලිබඳ එල්ටීටීඊයේ විවේචන පිලිබිඹු කරමින්, සහභාගි නොවුනි.

කුමාරතුංග අවස්ථාව යොදා ගත්තේ, ඒකාබද්ධ ආධාර මන්ඩලයක් පිහිටුවීමේ සිය ප්‍රයත්නයන්ට උදව් කරන ලෙස රැස්වූ ජාත්‍යන්තර නියෝජිතයන් වෙත පෙර නො වූ විරූ ආකාරයේ ආයාචනයක් කරනු පිනිස ය. තම ආන්ඩුවට "සමහර විට අසීරු තීන්දු ගැනීමට, සමහර විට භයානක තීන්දු ගැනීමට" සිදු වන බව කියමින් ඇය වැලපුනා ය. කුමාරතුංග "උතුරේ හා නැගෙනහිර ත්‍රස්තවාදී අන්තවාදයන්ට" -- එල්ටීටීඊය පිලිබඳ සඳහනකි -- පමනක් නොව," දකුන යැයි කියනු ලබන ප්‍රදේශවල පවතින සෙසු අන්තවාදයන්ට" -- එනම්, ඇගේ සගයන් වන ජවිපෙ සහ සෙසු ස්වෝත්තමවාදී සංවිධානවලට -- ද බැන වැදුනා ය.

ඒකාබද්ධ යාන්ත්‍රනයක් එල්ටීටීඊයට ජාත්‍යන්තර පිලිගැනීමක් ලබා දෙනු ඇත යන ජවිපෙ තර්කයට පිලිතුරු දීමට ද කුමාරතුංග ප්‍රයත්න දැරුවා ය. ඔවුනට සහනයක් දෙනවා වෙනුවට, "එල්ටීටීඊය ශ්‍රී ලංකාවේ ස්වෛරී රාජ්‍යයේ රාමුව ඇතුලත වැඩ කිරීමට එකඟ වී ඇතැ"යි ඇය ප්‍රකාශ කලා ය. කෙසේ වෙතත්, දින කිහිපයක් ඇතුලත, එල්ටීටීඊය නිවේදනයක් නිකුත් කරමින්, තමන්ගේ පාර්ශ්වයෙන් එවන් කිසිදු සම්මුතියකට එලඹ නැති බව පැවසී ය.

ජවිපෙ නියෝජිතයෝ කුමාරතුංගගේ කතාවට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා නිශ්ශබ්දව අසුන් ගෙන සිටියහ. ඒකාබද්ධ යාන්ත්‍රනයට ඔවුන් දක්වන විරුද්ධත්වයේ සැර බාල කරනු පිනිස සමුලුවට පෙරාතුව උත්සන්න රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයන් ගනනාවක් ම දරනු ලැබී ය. සුනාමිය මගින් ධීවර කර්මාන්තයට ඇති කෙරුනු බලපෑම පිලිබඳව නියෝජිතයන්ට කරුනු පැහැදිලි කිරීමේ අවස්ථාව ජවිපෙ ඇමතිවරයෙකුට ලැබුනු අතර ජපානයේ විශේෂ සාම නියෝජිත යසුෂි අකාෂිගේ ආරාධනයක් පරිදි ජවිපෙ නියෝජිත කන්ඩායමක් ජපානයේ සංචාරයක ද යෙදෙයි. කෙසේ වෙතත්, සමුලුවට අනතුරුව, ජවිපෙ නිවේදනයක් නිකුත් කරමින්, "අභ්‍යන්තර මතභේද ගැන විවෘතව කතා කලේ" යැයි කුමාරතුංග විවේචනය කලේ ය.

ජවිපෙ අපහසුතාවට පත් වීමට බලපෑ එක් හේතුවක් වූයේ බෞද්ධ භික්ෂුවක හා සිංහල අන්තවාදී ජාතික හෙල උරුමයේ මන්ත්‍රීවරයකු වූ අතුරලියේ රතන සම්මේලනයට කල කතාවකි. හෙල උරුමය සහ ජවිපෙ, සාම ක්‍රියාදාමය යලි ඇරඹීමට දැරෙන ප්‍රයත්නයන් හෙලා දකීම මගින්, වර්ගෝත්තමවාදී මනෝගතීන් ඇවිස්සීමේ ප්‍රතිවාදී උද්ඝෝෂනයන්හි යෙදී සිටී. කුමාරතුංගගේ කතාව හමාර වූ වහාම, කතා කිරීමට අවස්ථාවක් ඉල්ලා සිටි රතන, එල්ටීටීඊය "ත්‍රස්තවාදීන්" ලෙස හෙලා දකිමින් ද ඒකාබද්ධ යාන්ත්‍රනයට පහර දෙමින් ද දරුනු වාග් ප්‍රහාරයක් දියත් කලේ ය.

ඔවුන් දෙන මූල්‍ය ආධාර සම්බන්ධයෙන් ආධාර දෙන රටවලට හා ආයතනවලට ප්‍රශංසා කරමින්, ඔහු සභාවෙන් ඉල්ලා සිටියේ යම් හෝ සාකච්ඡාවක් වෙනුවෙන් එල්ටීටීඊය මත තදබල නව පූර්ව-කොන්දේසි පනවන ලෙසයි: "එල්ටීටීඊය වැනි ත්‍රස්තවාදී කන්ඩායමක් සමග සාකච්ඡා කරන ලෙස ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාවට බල කරන්නේ නම්, එල්ටීටීඊයේ කඳවුරු විනාශ කොට එම සංවිධානය නිරායුධ කිරීමට ඔවුහු අපට උදව් කල යුතු ය." වෙනත් වචනවලින් කිය තොත්, මොන යම් හෝ සාකච්ඡාවකට පෙර එල්ටීටීඊය ඔවුන්ගේ ආයුධ හා කඳවුරු අතහැර දැමිය යුතු ය -- මෙය වනාහි යටත් වීමකට සමාන ඉල්ලීමකි. මෙම ප්‍රකාශ, හෙල උරුමයට වල කපනු පිනිස තමන්ගේ ම ස්වෝත්තමවාදී උද්ඝෝෂනය උත්සන්න කිරීමට ජවිපෙට බල කරන බවට සැකයක් නැත.

## ආධාර පැකේජය

ආන්ඩුවේ දේශපාලන ගැටලු විසඳාලනවා වෙනුවට, සමුලුවේ දී පොරොන්දු වූ ආධාර එම ප්‍රශ්න උත්සන්න කිරීමට ඉඩ ඇත. දොරගුලු ලාගෙන පැවති සාකච්ඡාවක් හමාර වී පැමිනි මුදල් ඇමති සරත් අමුනුගම ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක් අමතමින් කියා සිටියේ," සුනාමි යලිගොඩනැගීමේ සහ සෙසු සංවර්ධන වැඩපිලිවෙලවල් හේතු කොට ගෙන ඩොලර් බිලියන 3ක් ඉක්මවා යන" පොරොන්දු හා එකඟතා ආධාර දෙන රටවලින් හා ආයතනවලින් ලැබුනු බවයි. මෙම ආධාරවලින් සියයට 95ක් ම "නය නො වන ආධාර" බවටත් "ඒවා යලි ගෙවීමක් අවශ්‍ය නො වන" බවටත් ඔහු පුරසාරම් දෙඩීය. "මෙම අරමුදල් ආන්ඩුවට ලබා දීම වෙනුවෙන් ඇත්තෙන් ම කිසිදු කොන්දේසියක් පනවා නැත."

ප්‍රථම කොටම, පෙන්වා දිය යුත්තේ," නව" පැකේජයට සුනාමි සහනාධාර ලෙස කලින් පොරොන්දු වූ ඩොලර් බිලියන 1.8 ද ඇතුලත් වන බවයි. සමහර වාර්තාවන්ට අනුව, සුනාමියෙන් විපතට පත් දස දහස් සංඛ්‍යාත ජනයාගේ දැවෙන අවශ්‍යතා තිබිය දී එය නො තකා, මුල් සහන පැකේජයෙන් නිදහස් කොට වැය කොට ඇත්තේ ඩොලර් මිලියන 55ක් තරම් කුඩා ප්‍රමානයකි. දෙවනුව, අමුනුගමට ම පිලිගැනීමට බල කෙරුනු පරිදි, "අප (එල්ටීටීඊය සමග) සාකච්ඡා මාවතේ නො ගිය හොත්, මෙම පොරොන්දුවලින් හා මුදල් සැපයුම්වලින් බොහොමයක් යථාර්ථයක් බවට පත් නො වනු ඇත.

ලෝක බැංකුවේ දකුනු ආසියානු අංශයේ උප සභාපති ප්‍රෆුල් පටෙල් තත්වය මෙසේ ප්‍රකාශයට පත් කලේ ය: "අපි ශ්‍රී ලංකාව මත කොන්දේසි පැනවීමක් නො කරමු. එහෙත් සුනාමි ආධාර බෙදා ගැනීම සම්බන්ධයෙන් ආන්ඩුව කොටි (එල්ටීටීඊය) සමග එකඟතාවකට එලඹෙනු දැක ගැනීමට ජාත්‍යන්තර ප්‍රජාව ඉතා කැමැත්තෙන් සිටී." ඔහු මෙසේ අනතුරු ඇඟවී ය: "ජාත්‍යන්තර ආධාර කොහොම වුනත් ලැබේ යැයි සැලකීමේ හැකියාවක් ශ්‍රී ලංකාවට නැත. බොහෝ

සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමය ශ්‍රී ලංකාව තුල ඔවුන්ගේ අවශ්‍යතාවන්හි හරය ලෙස පවතී."

පටෙල්ගේ ප්‍රකාශ මගින් අවධාරනය කෙරෙන්නේ, මහ බලවතුන්ගේ හා මූල්‍ය ආයතනවල සැබෑ උත්සුකතාව සාමය වත් සුනාමියෙන් විපතට පත් ජනතාවගේ සුබසාධනය වත් නො වන බවයි. වසර ගනනාවක් තිස්සේ "ජාත්‍යන්තර ප්‍රජාව" විසින් නො තකා හැර තිබූ රටේ දිගු කාලීන සිවිල් යුද්ධය, දිවයිනේ ලාභ ශ්‍රමය හා සම්පත් සූරාකෑමට බාධාවක් ලෙසත් වැඩෙන විදේශ ආයෝජන ඇද ගන්නා ධ්‍රැවයක් වන අසල්වැසි ඉන්දියාව තුල අස්ථායිකරන බලපෑමක් ලෙසත් දැන් සැලකෙයි.

සාම ගිවිසුමක් සඳහා බල කරනවා මෙන් ම, මහ බලවතුන් ඉල්ලා සිටින්නේ, ආන්ඩුව ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් වේගවත් කොට සමාජ වියදම් පාලනය කල යුතු බවයි. ආන්ඩුව සිය අයවැය හිඟය පිලිබඳ ඉලක්කයන්, ආර්ථික ප්‍රතිසංස්කරන පිලිවෙත් සහ කම්කරු නීතිරීති ප්‍රතිසංස්කරනය දිගටම ක්‍රියාත්මක කල යුතු යැයි ලෝක බැංකුව, ජාතික ආර්ථික සංවර්ධන මන්ඩලය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් පිලියෙල කරන ලද වාර්තා මගින් අවධාරනය කෙරෙයි.

ඛනිජ තෙල් හා විදුලි බල අංශ ඇතුලු ආන්ඩුවේ ප්‍රධාන ව්‍යවසායන් ප්‍රතිව්‍යුහකරනය කිරීමේ සැලසුම් ඉදිරියට ගෙන යාම සිය ආන්ඩුවේ අභිප්‍රාය වන බවත් එහෙත් ඒවා දිගට ම රාජ්‍ය පාලනය යටතේ පවත්වා ගෙන යන බවත්, කුමාරතුංග සිය කතාවේ දී හැඟවූවා ය. සිය රැකියා හා සේවා කොන්දේසි අහිමි වීම අරබයා උත්සුක වී සිටින තෙල් හා විදුලි බල කම්කරුවන්ගේ විරුද්ධත්වයට හා විරෝධතාවන්ට එජනිස දැනට මත් මුහුන දී සිටී. රහස් සාකච්ඡා තුල දී, භූගෝලීය ප්‍රාග්ධනයේ නියෝජිතයන්, වඩා දෘඩතර පියවර අවශ්‍ය යැයි ශ්‍රී ලංකාවේ අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටි බවට සැකයක් නැත.

ඔවුන්ට සමුලුවට ආරාධනා කොට නො තිබුනත්, සාම සාකච්ඡා යලි ඇරඹිය යුතු යැයි එල්ටීටීඊය ඉල්ලා සිටියේ ය. නෝර්වේ විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම්, සමුලුවට පෙරාතුව ලන්ඩනයේ දී එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු වන ඇන්ටන් බාලසිංහම් හමුවිය. බාලසිංහම් "ශ්‍රී ලංකා ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඒකාබද්ධ (ආධාර) යාන්ත්‍රනයක් වෙනුවෙන් ආධාර ලබා දෙන ප්‍රජාවගේ කැපවීම" සාදරයෙන් පිලිගත්තේ ය. "ඔවුන් මංමුලා සහගත ලෙස ජාත්‍යන්තර ආධාරවල අවශ්‍යතාවයෙන් පෙලෙන්" බව පවසමින් දෙමල ජනයා අතර වැඩෙන කලකිරීම පිලිබඳව උත්සුකතාව ද ඔහු පෙන්නුම් කලේ ය.

කෙසේ වෙතත්, කොලඹ පාලනය හා එල්ටීටීඊය සාම ක්‍රියාදාමය යලි ඇරඹීමට ආසන්න බවට කිසිදු සලකුනක් දක්නට නැත. ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනයක් පිහිටුවුව හොත් තමන් ආන්ඩුවෙන් ඉවත් වන බවට ජවිපෙ තර්ජනය කර ඇති තතු යටතේ පාලක එජනිස ගැඹුරින්ම භේද වී පවතී. කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා විපක්ෂ එජාප යන දෙගොල්ල ම සිංහල ස්වෝත්තමවාදයේ ගැඹුරින් ම ගිලී පවත්නා අතර එබැවින් එල්ටීටීඊයට දෙන ඕනෑම සහනයක් සිය ප්‍රතිවාදීන්ගේ අත් ශක්තිමත් කරනු ඇත යන කරුන පිලිබඳව උත්සුකව සිටී.

දිග්ගැසුනු දේශපාලන හිරවීම ව්‍යාපාරික කව තුල ගැඹුරු උත්සුකතා මතු කරයි. ආධාර සමුලුවට පෙරාතුව නිවේදනයක් නිකුත් කල ප්‍රධාන ව්‍යාපාරික සංවිධානවල ඒකාබද්ධ ව්‍යාපාරික සංසදය (ජේබිස්), අත්‍යවශ්‍ය විදේශ ආධාර ප්‍රවාහය අනතුරේ හෙලන්නේ යැයි ආන්ඩුව හා විපක්ෂය විවේචනය කලේ ය. මැයි 24 දා *ඩේලි මිරර්* පත්‍රයේ පල වූ කතුවැකියක් තවත් පියවරක් තබමින්, "ජාතික ගැටලු විසඳීමට සිය සහාය හා සහයෝගිතාව ලබා දීම ප්‍රතික්ෂේප කරන ඕනෑම පක්ෂයකට සහාය හා සහයෝගිතාව ලබා දීම" අත්හිටුවන ලෙස සංගත නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ය.

වත්මන් දේශපාලන හා ආර්ථික අර්බුදය විසඳාලන්නේ කෙසේ ද යන්න පිලිබඳව දිය හැකි මොන යම් හෝ උපදේශයක් ජේබිස් සංවිධානය හෝ කතුවැකි රචකයා අත නො තිබුනි. මෙම හිරවීම මගින් පැහැදිලිව අවධාරනය කෙරෙන්නේ, සාමය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි පිලිබඳව සාමාන්‍ය වැඩ කරන ජනතාව තුල පවත්නා මූලික අවශ්‍යතා හා අභිලාෂයන් ඉටු කිරීමෙහි ලා මොන යම් හෝ හැකියාවක් පාලක පන්තියේ කිසිදු කොටසකට නොමැති බවයි.

© www.wsws.org